# <u>නාට්‍ය හා රංග කලාව</u>

## <u>11</u> වසර

නූර්ති

19 වන ශත වර්ෂය අවසාන වන විට නූර්ති නාට්‍ය සම්ප්‍රදාය මෙරට ප්‍රචලිත විය. මෙම අලුත් නාට්‍ය සම්ප්‍රදාය මෙරටට රැගෙන ආවේ සංචාරක ඉන්දියානු නාට්‍ය කණ්ඩායම් විසිනි. මෙකල ඉන්දියාවේ බොම්බාය ප්‍රදේශයේ සිටි පාර්සි නම් ජාතියකින් අතර තිබූ තියටර් කාණ්ඩායම අතිශයින් ජනප්‍රියව පැවතුණි. මේ අතර ''බාලිවාලා'' නමැති පාර්සි ජාතිකයාගේ නායකත්වයෙන් බොම්බායේ එල්පින්ස්ටන් තියටර් සමාගම 19877 දී කොළඹට පැමිණ කොළඹ නගරය ආසනයේ නාට්‍ය දර්ශනයන් පවත්වන්නට විය. ඔවුන්ගේ නිෂ්පාදන වූයේ ඇලඩින්, හරිස්චන්ද්‍ර, ඔතෙලෝ, රෝමියෝ සහ ජුලියට හා අරාබි නිසොල්ලාසයේ කතා ආදියයි. මෙම නූර්ති නැරඹීම සඳහා ප්‍රේක්ෂකයින්ගෙන් ශාලාව පිරී ඉතිරී ගියහ. මෙම අලුත් නාට්‍ය සම්ප්‍රදාය සඳහා මෙතරම් ආකර්ශනය වන්නට හේතු වූයේ.

1. පස්ගොඩ ගසා නාඩගම් සඳහා සාදන ලද කරලිය වෙනුවට විචිත්‍ර නවීන අංග හෙවත් අංග රචනය, ඇඳුම් නිර්මාණය, වේදිකා ආලෝකය යොදාගත් ගෘහයක් තුළ තිබෙන පින්තූර රාමු වේදිකාව යොදා ගැනීම.

2. විචිත්‍ර දර්ශන පසුතල හා රංග භාණ්ඩ භාවිතය (චිත්‍ර වස්ත්‍ර)

3. නාඩගම් මෙන් රෑ පහන් වෙනතුරු හෝ දින දෙක තුනක් රඟ දක්වනවා වෙනුවට පැය තුන හතරකට නූර්තිය රඟදක්වන කාලය සීමාවීම.

4. නාඩගම්වල පිරිමි පමණක් රඟපෑ නමුදු නූර්තිවල ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම ඉතා අලංකාර ලෙස සැරසී චරිත නිරූපණය කිරීම. (දේශීය නාට්‍ය කලාවේ ස්ත්‍රී චරිත ස්ත්‍රීන් විසින්ම රඟපෑමට පටන්ගත් ප්‍රථම අවස්ථාව මෙය වේ.)

5. නාඩගම්වල භාවිතා කෙරෙන කර්ණාටක දකුණු ඉන්දියානු සංගීතය වෙනුවට නූර්ති සඳහා උතුරු ඉන්දියානු සංගීතය භාවිතයට ගැනීම.

6. උතුරු ඉන්දියානු සංගීතය ආශ්‍රයෙන් ගොඩ නැඟුණු මියුරු තනු නාට්‍ය තුළ අන්තර්ගත වීමත් නාට්‍ය අභිබවා ගීත මතුවී පෙනෙන්නට වීමත් දක්නට ලැබුණි.

7. සොකරි, කෝලම්, නාඩගම් ගම මුල් කොටගෙන ගමක් ඇතුළත රඟ දැක්වූ අතර නූර්ති රඟදක්ව ලද්දේ නගර මධ්‍යයේ සාදන ලද ශාලාවක් තුළය.

8. විනෝදස්වාදයේ විචිත්‍රත්වය සොයන කාර්ය බහුල නාගරික ප්‍රේක්ෂකයින්ට නූර්තිය කදිම විනෝද මාධ්‍යයක්වීම.

නූර්ති යනු ''නෘත්‍ය'' වචනයේ සාමාන්‍ය ව්‍යවහාරයකි. සිංහලන නාඩගමෙන් වෙනස් වූ මෙම නවීන සංගීත නාට්‍යයන්ට නෘත්‍ය යන වචනය භාවිතාවීම ආරම්භ වූයේ එක් නිසාදැයි කිව නොහැක. නූර්ති නාට්‍ය සම්ප්‍රදයේ සිංහල පුරෝගාමියා වූ සී. දෙන් බස්තියන් තම කෘතීන් හැඳින්වීම පිණිස ප්‍රථම වරට මෙම වචනය යොදගෙන තිබේ.

## සී. දෙන් බස්තියන් ජයවීර බණ්ඩාර

සී. දෙන් බස්තියන් ජයවීර බණ්ඩාර ක්‍රි.ව. 1852 පෙබරවාරි 18 වෙනි දින කොළඹ පිටකොටුවේ මැලිබන් වීදියේ නිවසක උපත ලද්දේය. ඔහු කුඩා වියේදී සිංහල, ඉංග්‍රීසි, පාලි හා සංස්කෘත යන භාෂා උගත්තෙකි.

භාරතයේ පාර්සි නාට්‍ය කණ්ඩායම් පැමිණීමට පෙර ඔවුන්ගේ නාට්‍යවල ගීත මෙහි ජනප්‍රිය වී තිබුණි. සිංහල නාට්‍ය නිෂ්පාදකයෝ පැම්'ණ නාඩගම් ප්‍රතිසංස්කරණය කොට අළුත් සිදු රාගතාල ඇතුළත් කළ. මේ කාර්යයේලා පළමු වැන්නා ලෙස සඳහන් කළ හැක්කේ සී. දෙන් බස්තියන් ජයවීර බණ්ඩාරයනය.

නාඩගම් රචකයෙකු වූ තම රෝලිනා නාඩගම අලුත් සිංදු රාගතාල ඇතුළත් කොට අළුත් ශෛලියකින් සකස් කළේය. පැරණි නාඩගම් ලක්ෂණ ඉවත්කොට හිංදුස්ථානි රාග තාලත්, දෙමළ රාගතාලත්, එවකට ජනප්‍රියව තිබූ ඉංග්‍රීසි සිංදු තාලත් ඇතුළත් කර ගනිමින් රෝලිනා නාටයය නිෂ්පාදනය කළේය.

ඔහු රොලීනා නාටකයේදී බහුබූත කෝලම ඉවත් කර විකටයාගේ චරිතය ඇතුළත් කළේය. පොතේ ගුරු චරිතය ද ඉවත් කළේය. ඔහු රොලීනා නම් කළේ නෘත්‍යයක් වශයෙනි.

රොලීනා නාටකයෙන් පසු රෝමියෝ සහ ජුලියට්, ප්‍රැන්ක්ලෝ සහ ඉන්ගර්ලි, ලියොනයින් සහ එමලින්, යන නාට්‍යයද නිෂ්පාදනය කළේය.

ඔහු රචනාකොට නිෂ්පාදනය කරන ලද නාට්‍ය සංඛ්‍යාව දෙස බලන විට රොම්ලින් හෙවත් දිව්‍ය කුසුම,සිංහබාහු, සුදස සහ සාලිනී, ශූලා, ස්වර්ණ තිලකා, දිනතර, ඇලඩින්, බැඩොව්රා. අලිබබා, හරිශ්චන්ද්‍ර, ඉන්ද්‍රසභා, වැනීසියේ වෙළෙන්ද, ඈස් යූ ලයික් ඉට් යන නාට්‍ය සඳහන් කළ හැකිය.

මෙම නාට්‍යවලින් වැඩි සංඛ්‍යාවක් පිටකොටුවේ මල්වත්තේ ඃසකදර්ක ඇකක* පුෂ්ප ශාලාවේ රඟ දක්වන ලදී.

සී. දොන් බස්තියන්ගේ රොලීනා, ඇහැලේපොළ, දිනතර යන මුල් නෘත්‍යවල නාඩගම් ලක්ෂණ බහුලව දක්නට ලැබුණි. අනෙක් නෘත්‍යවල බොම්බායේ සට විත් රඟ දැක්වූ නෘත්‍ය කණ්ඩායම් වල නාට්‍යවල ආභාසය දක්නට ලැබුණි.

සී. දෙන් බස්තියන්ගෙන් පසු නූර්ති නාට්‍ය ඉතිහාසය පරීක්ෂාකාර බලන විට නාට්‍යකරුවන් බොහෝ සංඛ්‍යාවක්ද, බොහෝ නාට්‍ය සංඛ්‍යාවක්ද දක්නට ලැබේ.

## නීතිඥ ඇම් ජොන් ද සිල්වා

සී. දෙන් බස්තියන් ජයවීර බණ්ඩාරගෙන් පසු නූර්ති නාට්‍ය යුගය බැබලවූ නාට්‍ය කරුවා ලෙස හැඳින්විය හැක්කේ නීතිඥ ජෝන් ද සිල්වාය.

1857 දී කෝට්ටේ උපත ලැබූ මොහු පිටකෝට්ටේ ක්‍රිස්තියානි මිෂනාරි විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා ඉංග්‍රීසි ගුරුවරයෙකු වශයෙන් රක්ෂාව කරන අතර නීතිය හදරා නීතිඥයෙකු වශයෙන් සමර්ථ විය.

නීතිඥ වෘත්තියෙන් තෘප්තිමත් නොවූ මොහු නාට්‍ය කලාවට ඇදී ගියේය.

සී. දෙන් බස්තියන් ජයවීර බණ්ඩාරයන්ගේ නාට්‍ය දැක පැහැදුන ජෝන් ද සිල්වා තමන් විසින්ද නාට්‍යයක් නිර්මාණය කිරීමට ඉටා ගත්තේය. ඔහු ග්‍රාන්ඩ්පාස්හි පදිංචිව සිටි ප්‍රසිද්ධ සංගීතඥයෙකු වූ ''අබ්දුල් ලතීෆ්'' මහතාගේ හිංදුස්ථාන් රාගතාල ගෙන ''නල දමයන්ති'' නම් නාට්‍ය රචනා කොට 1878 දී ෆ්ලවර් හෝ හි (පුෂ්ප ශාලාවේ) රඟ දැක්විය.

1886 මැයි 31 ද පිටකොටුවේ පුෂ්ප ශාලාවේ දී රාමායණය රඟ දැක්වීමට කටයුතු සූදනම් කර තිබූ නමුත් එම ශාලාවේ තිබූ රංග භාන්ඩ නාට්‍ය ඇඳුම් පැළඳුම් තිර ආදියට සතුරන් විසින් ගිනි තබන ලදී. ඉන් අධෛර්ය නොවූ ජොන් ද සිල්වා පසුව එම නාටකය යළි නිෂ්පාදනය කොට 'ගිනිගත් රාමායණය' නමින් දෙවන වර රඟ දැක්වීය.

1900 දෙසැම්බර් මස කාංජි ජය්‍ා ශංකර් සහ ඔහුගේ බෑණා වූ විශ්වනාත් ලෞජී යන සංගීතඥයෝ දෙදෙනා නීල් විදියේ වූ බණ්ඩාරනායක වලව්වේ නත්තල් උත්සවයකට සංගීතය වාදනය කිරීමට පැමිණියහ.

මෙම උත්සව අවස්ථාවට පැමිණි සිටි ප්‍රභූන් අතර නීතිඥ ජෝන් ද සිල්වා සිටියේය.

මොවුන්ගේ සංගීත වාදනයෙන් පැහැදුණු ජෝන් ද සිල්වා තම නාට්‍යවලට ගීත තනු හා සංගීතය සඳහා විශ්ව නාත් ලෞජී යොද ගත්තේය. ජය්‍ා ශංකර් ආපසු සිය රටවූ ඉන්දියාව බලා ගිය අතර විශ්වනාත් ලෞජී ජෝන් ද සිල්වාගේ ඉල්ලීම පරිදි නතරවිය.

ජෝන් ද සිල්වා විසින් රචිත සිරි සඟබෝ නාටකයට විශ්වානාත් ලෞජී සංගීතයහා ගී තනු නිර්මාණය කළේය. ඔහුගේ සංගීතය නිසා ඔප් නැංවුන සිරිසඟබෝ නාටකය බෙහෙවින් ජනප්‍රිය විය.

ජෝන් ද සිල්වා සිය ජීවිත කාලය තුළ නාට්‍ය 54 ක් රචනා කළේය. උත්තර රාම චරිතය, සකුන්තලා, සිරි සඟබෝ,

**නීතිඥ චර්ලිස් ඩයස් අමරතුංග**

1878 දී කැලණියේ තල්වත්ත ග්‍රාමයේ උපන් චාර්ල්ස් ඩයස් ශාන්ත පස්තියන් රාජකීය විදුහලෙන් ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි ආදී විෂයන් උගත්තේය. පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේ ශ්‍රී ධර්මාලෝක හා ශ්‍රී ධර්මාරාම යන නාහිමි වරුන්ගෙන් සිංහල පාලි හා සංස්කෘත භාෂා උගත්තේය.

1903 දී ගුරු වෘත්තියට බැඳුන චාර්ලිස් ඩයස් චිත්‍ර කලාව, නාට්‍ය සංගීතය පිළිබඳව ද දැනුමක් ලබා ගත්තේය.

1903 දී ගුරු වෘත්තියට බැඳුන චාර්ලිස් ඩයස් චිත්‍ර කලාව, නාට්‍ය සංගීතය පිළිබඳව ද දැනුමක් ලබා ගත්තේය.

මරදානේ ටවර් හෝල් රඟහල විවෘත කිරීමේ උළෙලට මොහු පණ්ඩුකාභය නමින් නාට්‍යයක් රචනාකර වේදිකාවට ගෙනාවේය.

ටවර් හෝල්හි සිංහල නාට්‍ය සභාවේ සහ ආර්ය සිංහල නාට්‍ය සභාවේ ප්‍රධාන නාට්‍ය ග්‍රන්ථ කතුවරයෙකු ලෙස ද සේවය කරමින් නාට්‍ය 34ක් නිෂ්පාදනය කළේය.

පණ්ඩුකාභය, ඇලඩින් සහ පුදුම පහන, නල දමයන්ති, පද්මාවතී, කාශ්‍යප ධාතුසේන, දුටු ගැමුණු, උත්තර ගැමුණු, වලගම්බා, කුසරාජ චරිතය, දේව ශර්ම, ශ්‍රී වික්‍රම රාජසිංහ, උම්මග්ග ජාතකය, විජය, ධර්මශෝක, කාවන්තිස්ස, සිවම්මා ධනපාල, ඔතෙලෝ, කාව්‍යශේඛරය, විධුර ජාතකය, නාගානන්ද, මහා පරාක්‍රමබාහු, භූරිදත්ත, මායාවතී, චන්ද්‍රගුප්ත, හේමමාලි, උදක රක්ෂස ප්‍රශ්ණය, ධනපාලගේ වික්‍රමය, ටිකිරි මලී, උදක රාජචරිතය, රාවණා.

මොහු නාට්‍ය රුසක සංගීතය සහ ගී තනු නිර්මාණය කර ඇත්තේ ඩබ්ලිව්, සදාසිවම් නම් සංගීතඥයාය.

මොහුගේ නූර්ති නාට්‍ය ඉතිහාසයය දෙස බලනවිට නීතිඥ ජොන් ද සිල්වා හැරුණු විට ජනප්‍රියම නාට්‍ය නිර්මාණරුවා වූයේ චර්ල්ස් ඩයස් අමරතුංග ය.

අවසන් කාලයේ  කොළඹ දෙමටගොඩ දියකඩිත්ත ප්‍රදේශයේ ''සිල්වින් විලා'' නිවසේ පදිංචිව සිටි අතර 1944 ජූලි 23 ද මිය ගියේය.

නාට්‍ය කලාව පිරිහීමට බලපෑ කරුණු

නූර්ති නාට්‍ය කරුවන් බොහෝ දෙනෙකු විසින් නීතිඥ ජෝන් ද සිල්වා හා නීතිඥ චාර්ලිස් ඩයස්ගේ නාට්‍ය කෘතිවල ලක්ෂණ අනුකරණය කරන්නට පටන් ගැනීම ඒකාකාරී ස්වභාවයක් දක්නට ලැබුණි.

සිරිසේන විමලවීර හා බී. ඒ. ඩබ්ලිව්. ජයමාන්නගේ නාට්‍ය වල බටහිර ස්වාභාවික නාට්‍ය ලක්ෂණ දක්නට ලැබුණි. ඒවා පැරණි නූර්ති මෙන් ආකර්ෂණීය නොවීය. අලංකාර ඇඳුම් පැළඳුම් පසුතල භාවිතා නොකෙරුණු අතර රෙදි, කෝට්, කලිසම්, සපත්තු භාවිත කෙරුණි. මේවායෙන් සංකර සංස්කෘතික ලක්ෂණද, සමාජ කතන්දරද දක්නට විය. චිත්‍රපට ලක්ෂණද භාවිතා විය. මෙය නූර්තියේ පරිහානි ලක්ෂණ ලෙස පෙනුණි.

නළු නිළියන් අතර සදචාර නොවූ සම්බන්ධතා වීම, මත්පැන් භාවිත කිරීම පවා පරිහානි ලක්ෂණ ලෙස පෙනුණි.

නළු නිළියන් අතර සදචාර නොවූ සම්බන්ධතා වීම, මත්පැන් භාවිත කිරීම පවා පරිහානි ලක්ෂණ ලෙස සඳහන් කර ඇත.

නාට්‍ය ප්‍රදර්ශනය වුන රංග ශාලාවල චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම නිසා ප්‍රේක්ෂකයෝ නූර්ති වලට වඩා චිත්‍රපටි කෙරෙ ඇදීයන්ට වූහ. ඒ නිසා ආදයම් අඩු වීමත්, නාට්‍ය ප්‍රේක්ෂකයන් හිඟවීමත් නිසා නූර්තියේ පරිහානිය කඩිනම් විය.

බී. ඒ. ඩබ්ලිව්, ජයමාන්න හා සිරිසේන විමලවීර පවා නාට්‍ය නිෂ්පාදනය අත්හැර චිත්‍රපට නිපදවීමට පටන් ගත්හ. මේ නිසා සිංහල ප්‍රේක්ෂකයෝ නූර්ති හා ටීටර් වෙනුවට චිත්‍රපට නැරඹීමට පෙළඹුනහ.

නාට්‍ය දර්ශන වලදී ප්‍රේක්ෂකයින් ආකර්ෂණය කරගැනීමට චිත්‍රපටවල මෙන් අතිරේක නැටුම් ද, විකට ජවනිකා ද, ඇතුළත් කරන්ට වූහ, මෙය නූර්ති නාට්‍ය ගුණාත්මක අතින් ද පිරිහීමට හේතුවිය.

නූර්ති නාට්‍ය සඳහා ද නාට්‍ය පෙළක් භාවිතා කෙරුණි. නූර්ති නාට්‍යයන් සඳහා ස්වාභාවික සංවාද ද, ගීත ද භාවිත කරන ලදී. නාඩගම්වල මෙන් රිද්මයානුකූල හා ගීතවත් වූ වාද භාවිතා නොකළහ. නාට්‍ය පෙළ රචනා කිරීමේදී කෙටි ජවනිකා රාශියක් අන්තර්ගත වන පරිදි සකස් කරන ලදී.

උත්තර භාරතීය සංගීතය යොදා ගැණුනි. ඒ සඳහා හින්දුස්ථානි රාගතාල භාවිත කෙරුණි. ගීත රචනා කිරීමේදී දෙමළ සිංහල වචන යොදා ගැණුනි. ගීත සඳහා තනු නිර්මාණය කරන ලද සංගීතයන් අතර කැපී පෙනුනේ අබ්දුල් ලතීෆ් වූ, විශ්වනාත් ලෞජි, ඩබ්ලිව්, සතාසිවම්, නවාබ් කාං ආශී යන නූර්තියි. නාඩගම්වල භාවිතා වූ දක්ෂිණ භාරතීය කර්ණාටක ගීතයට වඩා මෙම නූර්ති නාට්‍යවල භාවිත වූ හින්දුස්ථානි ගීතය කර්ණ රසායන විය.

නූර්ති නාට්‍ය දර්ශනයක් පැය 3ක් 3 1/2ක් පමණ කාලයට සීමාවිය. පෙර නාඩගමක් රැයක් පුරා හෝ දවස් කිහිපයක් රඟ දැක්වුණි. නූර්තියේ ජවනිකා රාශියක් තිබුණද